

HG

# 10
# ඩිජිටල් පසුපිරියම

ඩිජිටල් ඡායාරූපකරණයට එළඹෙන නවක ඡායාරූප ශිල්පීන්ට Photoshop මෘදුකාංගය භාවිතා කිරීමට පෙළඹවීම අරමුණු කොට මෙම පරිච්ඡේදය ඉදිරිපත් කෙරේ. ඡායාරූපයක පැවතිය හැකි මූලික දෝෂ මග හැරගෙන ආකර්ශනීය ඡායාරූපයක් ඉදිරිපත් කිරීමට මින් අවස්ථාව උදාවනු ඇත. මෙම ප්‍රාථමික පියවර හොඳින් පුහුණු වූ පසුව Photoshop භාවිතයේ උසස් තලයන්ට ප්‍රවේශ විය හැකිය.

පසු පිරියමේදී භාවිතා වන මෘදුකාංග සිය ගණනක් ඇති අතර මෙහිදී විස්තර කෙරෙන්නේ Photoshop මෘදුකාංගයයි. ලංකාවේ බොහෝ දෙනා භාවිතා කරන CS6 ආකාරයයි. එය නිපදවා ඇත්තේ ඡායාරූප ශිල්පීන් හා ග්‍රැෆික් චිත්‍ර ශිල්පීන් යන දෙපිරිසටමය. මෙහි දක්වා ඇත්තේ ඕනෑම ඡායාරූප ශිල්පියෙකුට වටහාගත හැකි ඉතා සරළ ක්‍රමවේද කීපයකි. දක්වා ඇති ක්‍රමයන්ට වඩා ඉක්මන් හා සියුම් තවත් ක්‍රමවේද තිබෙන්නට පුළුවන.

## ඩිජිටල් පසුපිරියමේ ප්‍රධාන පියවර කිහිපයකි

ඩිජිටල් ඡායාරූපය කැමරාවේ හා කාචයේ ධර්මතාවයන්ට අනුකූල වන සේ ලැබුනද, සටහන්වීම බොහෝවිට සෙන්සරයේ හැකියාවන් මත රඳා පවතී. යම් දර්ශනයක ඡායාරූපය යනු, ඇසින් දුටු දර්ශනයම නොවේ. රසායනික ඡායාරූපකරණයේදී වුව දර්ශනය ඡායාරූපයක්